# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 38 දරන
# යුද්ධ හමුද (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ඔක්තෝබර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ඔක්තෝබර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00

# 1990 අංක 38 දරන යුද්ධ හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ඔක්තෝබර් මස 22 වන දින]

එල්. ඩී—ඕ. 12/88

යුද්ධ හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1990 අංක 38 දරන යුද්ධ හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) යුද්ධ හමුදා පනතේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) (iii) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 357 වන අධිකාරයේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(iii) ඒ තැනැත්තා බල ලත් නිලධරයකු නොවන සෙබළකු වන අවස්ථාවක, චෝදනාව සම්බන්ධයෙන් ලඝු ලෙස කටයුතු කළ යුතු ය. නැතහොත් යුද්ධ හමුදාධිපතිවරයා විසින් හෝ යුද්ධ හමුදාධිපතිවරයා විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලබන කර්නල්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන යම් නිලධරයකු විසින් හෝ ලඝු ලෙස කටයුතු කරනු ලැබීමට චෝදනාව යොමු කළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි පාර්ශ්ව සටහනෙහි "බල ලත් නිලධරයකු වන" යන යෙදුම වෙනුවට "සෙබළකු වන" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) "හෝ බල ලත් නිලධරයකු වන" යන යෙදුම වෙනුවට "හෝ සෙබළකු වන" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) "ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) (ii) වන ඡේදයේ සඳහන්" යන වචන වෙනුවට "ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) (ii) වන හෝ (iii) වන ඡේදයේ සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) "(iii) මේ පනතින් බලය දෙනු ලබන පරිදි ඔහුගේ වැටුප් පෙන් යම් අඩුකිරීමක්" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ;

"(iii) මේ පනතින් බලය දෙනු ලබන පරිදි ඔහුගේ වැටුප් පෙන් යම් අඩු කිරීමක් ; සහ

2—D 004071—5,600 (89/03)

(ඇ) චූදිතයා මාණ්ඩලික සැරයන්වරයකු වන අවස්ථාවක, පහත දැක්වෙන සියලු දඬුවම් හෝ ඉන් කිසිවක් ඔහු මත පනවනු ලැබිය යුතු ය:—

(i) තදබල තරවටු කිරීමක් හෝ තරවටු කිරීමක්;

(ii) මේ පනතින් බලය දෙනු ලබන පරිදි ඔහුගේ වැටුපෙන් යම් අඩු කිරීමක්; සහ

(ඈ) චූදිතයා සැජන්ට්වරයකුගේ හෝ ඉන් පහළ නිලයක් දරන අවස්ථාවක පහත දැක්වෙන සියලු දඬුවම් හෝ ඉන් කිසිවක් ඔහු මත පනවනු ලැබිය යුතු ය:—

(i) චූදිතයා සැජන්ට්වරයකු නම්, ඔහු කෝප්‍රල්වරයකුගේ නිලයට ද, නැතහොත් චූදිතයා කෝප්‍රල්වරයකු නම් ලාන්ස් කෝප්‍රල්වරයකුගේ නිලයට ද, නැතහොත් චූදිතයා ලාන්ස් කෝප්‍රල්වරයකු නම් ඔහු සෙබළකුගේ නිලයට ද ප්‍රත්‍යාවර්තනය කරනු ලැබීමට ආඥාවක් කළ යුතු ය:

එසේ වුව ද, 40 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) (iii) වන ඡේදයේ සඳහන් බලධරයා යුද්ධ හමුදාධිපතිවරයා වන්නේ නම් ද, චූදිතයා කෝප්‍රල්වරයකුගේ හෝ ඉන් පහළ නිල යක් කරන්නේ නම් දින 112 ක් නොඉක්මවන්නා වූ යම් කාලසීමාවක් සඳහා ඔහු රඳවා තබනු ලැබීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ බලධරයා කෝප්‍රල්වරයකුගේ හෝ ඉන් පහළ නොවන නිලයක් දරන නිලධරයකු නම් දින 90 ක් නොඉක්මවන යම් කාලසීමාවක් සඳහා ඔහු රඳවා තබනු ලැබීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(ii) තදබල තරවටු කිරීමක් හෝ තරවටු කිරීමක්;

(iii) මේ පනතින් බලය දෙනු ලබන පරිදි ඔහුගේ වැටුපෙන් යම් අඩු කිරීමක්.".

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.